# රාල සෙවූ නිධානය



තාරුමා නිම්තාරි වීරකෝන්

# රාල සෙවූ නිධානය

තාරුමා නිම්තාරී වීරකෝන්

**කතෘ**

**පළමු දිගහැරීම**

මහ/මහාමායා බාලිකා විද්‍යාලය

7 ශ්‍රේණිය D

2025/02/08

**ISBN:978-624-208-278-3**

# පිදුම

මෙහි එන කතාව ලිවීමට

මාව දිරිමත් කළ

හා

මා හට සහයෝගය ලබාදුන්

මාගේ දෙමාපියන්ට

හා

දයාබර ගුරු මෑණිවරුන්ට

හා

පියවරුන්ට

මහත් සෙනෙහසින් යුතුව

මෙම කෘතිය පිරි නමමි.

**තාරුමා නිම්තාරි වීරකෝන්**

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිණුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය  වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡෙද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්තදස්සි මාහිමිපාණන් වහසේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි.ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුශලතාව එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන් ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර



ඔන්න ඉතින් මේ කතාවෙත් තියෙනවා එක

ගමක්. මේ ගමේ ජීවත් වෙන ගොවියෙක් වුණු රාල

සුපුරුදු පරිදි ම තමන්ගේ කුඹුරට ගොස් වැඩ ආරම්භ

කළා.

කුඹුර කොටන රාලට පුංචි පෙට්ටගමක් හම්බවුණා.

මේක දැකපු රාලට හරි පුදුමයි.

රාල ඒක ඇරලා බැලුවා.

ඒක ඇතුලේ තිබුණ දේ දැකලා රාල කළකිරීමට පත්

වුණේ, ඒ පෙට්ටගම ඇතුලේ කොළ කැබැල්ලක්


පමණක් තිබු නිසයි.

ඒත් රාලගේ කළකිරීම වැඩි වෙලාවක් තිබුණේ නෑ.

රාල ඒක දිග ඇරලා බැලුවා.

අනේ,....

ඒක නිධානයක සිතියමක්.



රාල මේ ගැන ගමේ අනිත් අයටත් කිව්වා. මේක අහපු ගමේ ඇයෝ මෙහෙම හිතුවා. “රාල කොච්චර ගොවිතැන් කලත් හරි මෝඩයා. අපි රාලව රවට්ටලා කොහොම හරි මේ නිධානේ ගමු.” එයාලා රාලට කතා කරලා කිව්වා. “රාල ඔයානේ මේ සිතියම හොයා ගත්තේ, ඒක නිසා ඔයාම මේ නිධානේ හොයාගෙන එන්න” කියලා. රාල මේ අදහසට කැමති වුණා. ඒත් මේ මෝඩ රාලට මේකේ ඇත්ත අදහස තේරුණේ නෑ. ඒ අතර ගමේ අය මෙහෙම කතා වුණා. “දැන් ඉතින් රාලට තමයි හැම කරදරයක්ම, හැබැයි නිධානේ ගන්නේ අපි” කියලා.

පසු දින රාල ගමන යන්න පිටත් වුණා.

අවශ්‍ය කළමණාකරණ ඔක්කොම ගත්තා.

රාල සිතියමේ විදිහටම ගමන් කරා.

රාල ඝන කැලෑවකට ඇතුල් වුණා.

ඝන කැලෑවේ ඇවිදින රාල එක පාරටම ලොකු වලකට වැටුණා.

කර කියාගන්න දෙයක් නැතුව සිටි රාල එක උමගක් දැක්කා.

රාල ඒ උමග දිගේ බඩ ගෑවා.

උමග ඉවර වුණේ ඝන කැලෑව මැදින්.....



රාල සිතියම බැලුවා ඒකේ තිබුණු විදිහට රාල කැලෑව මැදින් ගලා යන ගඟ ගාවට ගියා. ඉන් පසු රාල නැවතත් සිතියම බැලුවා ඒකේ විදිහටනම් රාල යන්න ඕනෑ ගඟෙන් එගොඩ තියෙන ගල් ගුහාවකටයි.

රාල ගල් ගුහාව ගාවට ගියා.


හැබැයි ගල් ගුහාව ඇතුලේ නිධානයක් තියා නිධානයක

සළකුණක්වත් තිබුණේ නෑ.

ඒත් සිතියමේ හැටියටනම් නිධානය මේ ගල්

ගුහාවෙමයි තියෙන්න ඕන.

රාලට කිසි දෙයක් හිතා ගන්න බැරි වුණා.



වට පිට බැලුව රාල ගල් ගුහාවේ මුල්ලකින් එල්ලෙන

වැල් දැක්කා.

රාල ඒ වැල් අතරින් එබී බැලුවා රාල දුටු

දෙයින් පුදුමෙනුත් පුදුමයට පත් වුණා.

ගල් ගුහාවක්

ඇතුලේ දිය ඇල්ලක්


රාල දිය ඇල්ල ළඟට යන්න

හැදුවා විතරයි

රාල ලිස්සලා ගිහින් ලොකු ගලක

හැප්පුනා.

ඔහු ඉන් පසු දිය ඇල්ල ළඟට ගියා.
“ගල් ගුහාවක් ඇතුලේ දිය ඇල්ලක්
මගේ ඇස් අදහා ගන්නත් බැහැ
කොයි තරම් ලස්සනද?”
රාල සිතුවා රාත්‍රියට දිය ඇල්ල
ළඟ විවේක ගන්න.
රාල උදෑසනම අවදි වී බලන විට
සිතියම නැති වී තිබුණා.
රාල කලබල වී වටපිට බලා
සිතියම සෙව්වද එය තිබුනේ නෑ.
ඒත් ඔහුට එක් තැනක්
බැලීමට නොහැකි වුණා,
ඒ තමයි ඔහුගේ ගමන් මල්ල.



ගහ ළඟට ගොස් කෑමට යමක් සොයා එම මල්ල අදින විට ඔහුට සිතියම හමු වුණා.

“අනේ අනේ ඔහෙත් කරන දේවල් මම හොඳට ම බය වුණා.” යැයි

මෝඩ රාල සිතියමට පැවසුවා.

ඉන් පසු ඔහු නැවත තම ගම බලා පිටත් වීමට ගමන

ආරම්භ කළා.

හෝරා කිහිපයකට පසු තම ගම වෙත

ළඟා වීමට රාලට හැකි වුණා.


ගමට එන රාල

මෙහෙමත් හිතුවා.

"මම දැන් මොකද කරන්නේ ?

ගමේ ඇයෝ බලාගෙන ඇති මම නිධානය ගේනකන්

කමක් නෑ මම ඇත්තම කියනවා" කියලා.



නැවත ගමට එන රාලව දැකලා ගමේ ඇයෝ මෙහෙම කතා වුණා.

“අන්න රාල නේද? කෝ ඒත් කොහෙද නිධානේ?” කියලා.

ඒ අතර සමහරු රාලට මෙහෙමත් කිව්වා.

“අනේ මෝඩ රාල ඔය වගේ පොඩි වැඩක්වත් කරගන්න බැරිද?” කියලා.

ඒත් රාල ඒ කිසිවකට පිළිතුරු නොදී ම ඉදිරියට ගියා.

ඉන් පසු හැමෝටම ඇහෙන්න කිව්වා

“මම හොයාගත්ත නිධානේ තියෙන්නේ කැලෑව මැද

ලොකු ගල් ගුහාවක.

ඒ නිධානේ දියඇල්ලක් එතන හරිම ලස්සනයි.”

කියලා.



“රාල අපිට නම් ඔය කතාව විශ්වාස නැහැ.., හරි අපිව එහෙනම් එතනට එක්කරගෙන යන්න...” ගම්මු කිවුවා.

“හරි මම එක්කන් යන්නම්” රාල කිව්වා.

පසුවදාම රාලඔවුන් සමඟ දිය ඇල්ල ළඟට ගියා.

දියඇල්ල දුටු ගමේ ඇයොන්ට හරි පුදුමයි.

දිය ඇල්ලේ සුන්දරත්වය විදිමින් සිටින අතර ගමේ

එක් මහල්ලෙක්,

"මෙය අපිට ස්වභාවධමර්යෙන් ලබා දුන් නිධානයක්.

මේ නිධානය කාසි වලට වඩා වටිනවා"

යැයි පැවසුවා.

ඉන් පසු සියලුම දෙනා රාලගෙන් සමාව ගත්තා.

නැවත ගම වෙත ගිය ඔවුහු සතුටින් ජිවත් වුණා.

## පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැඟීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි.එම බීජ දලු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි.මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය,දියණියන්,ගුරුභවතුන්,දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්විමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි.මෙයට පිළියන් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නඟා දි තිබේ.තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛණ දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්.

ISBN:978-624-208-278-3